දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපැල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )


සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

මගේ අංකය )
எனது இல )NA/06/T/replacement/2018
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2018.03. 02
Date )

# සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
# சுகாதார,போசணைமற்றும் சுதேசவைத்தியஅமைச்சு
# Ministry of Health, Nutrition& Indigenous Medici

---

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී ලංකා ජාතික රෝහල)
සියලුම ශික්ෂණ රෝහල්/මහ රෝහල් අධ්‍යක්ෂවරුන්
සියලුම මූලික රෝහල්/විශේෂිත ආයතන ප්‍රධානින් ඇතුළු
රේඛීය අමාත්‍යාංශය යටතේ පාලනය වන සියලුම ආයතන ප්‍රධානින් වෙත.

<u>2013, 2014, 2015 හා 2016 වාර්ෂික ස්ථාන මාරු නියෝග මත සිටින</u>
<u>හෙද/හෙදි නිලධාරින්ගේ තොරතුරු ලබා ගැනීම</u>

2014 A කණ්ඩායමට පත්වීම් ලබා දිම සඳහා එක් එක් රෝහලින් **2013, 2014, 2015** හා **2016** වසරවල වාර්ෂික ස්ථාන මාරු නියෝග මත සිටින අනුප්‍රාප්තිකයන් අවශ්‍ය නිලධාරින්ගේ තොරතුරු ලබා ගැනීමට අවශ්‍යව ඇත

**02.** ඒ අනුව, මේ වන විට ඔබ රෝහලේ /ආයතනයේ සේවය කරන, දැනටමත් ස්ථාන මාරු නියෝග ලබා සිටින හා අනුප්‍රාප්තිකයන් අපේක්ෂාවෙන් සිටින **2013, 2014, 2015** හා **2016** වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා ඇති හෙද/හෙදි නිලධාරින්ගෙන් ඇමුණුම **01** මගින් දැක්වෙන ආකෘතිය සම්පූර්ණ කරවා ගැනිමට කටයුතු කරන්න.

**03.** එම ඇමුණුම **01** මගින් දැක්වෙන ආකෘති මගින් අනුප්‍රාප්තිකයන් අපේක්ෂාවෙන් සිටින නිලධාරින්ගේ තොරතුරු අනුව ඇමුණුම **02** ආකෘතිය සම්පූර්ණ කර ඇමුණුම **02** ආකෘතිය හා ඇමුණුම **01** ආකෘති සියල්ලමද පහත ලිපිනයට **2018.03.09** දිනට පෙර අතින් ගෙනවිත් භාරදිමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

අධ්‍යක්ෂ ( පාලන) 01
සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය,
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10

**04.** එසේම ඇමුණුම **02** ආකෘතියට තොරතුරු ඇතුළත් කිරිමේදී IskoolaPotha font භාවිත කරමින් දත්ත පරිගණකගත කර ඇමුණුම **02** ආකෘතියේ සඳහන් තොරතුරුවල මෘදු පිටපතක් <u>chathuranivitharana@yahoo.com</u>යන විද්‍යුත් ලිපිනයට එවිමටද කාරුණික වන්න.

**05.** මෙය **2013, 2014** හා **2015** වසරවල වාර්ෂික ස්ථාන මාරු නියෝග මත සිටින නිලධාරින් සඳහා අනුප්‍රාප්තිකයන් ලබාදෙන අවසාන අවස්ථාව වන අතර මින් ඉදිරියට මේ වන තෙක් ක්‍රියාත්මක වි නොමැති **2013,2014** හා **2015** වාර්ෂික ස්ථාන මාරු නියෝග සියල්ල අවලංගු කරනු ලැබේ. තවද මීට පෙර මගේ අංක NA/02/10/2016 හා 2017.04.08 දිනැති ලිපිය , NA/02/07/2017 හා 2017.11.30 දිනැති ලිපිය , NA/02/10/2017 හා 2018.01.30 දිනැති ලිපිය මගින් අනුප්‍රාප්තිකයන් ලබා දී කිසිවෙකුටත් නැවත අනුප්‍රාප්තිකයන් ලබා නොදෙන බව වැඩිදුරටත් දන්වමි.

ඒ.එම්.කේ.කේ. අත්තනායක,
අතිරේක ලේකම් (පාලන)02
ලේකම් වෙනුවට
සෞඛ්‍ය පෝෂණ හා දේශිය වෛද්‍ය අමාත්‍යාංශය

ඒ. එම්. කේ. කේ. අත්තනායක
අතිරේක ලේකම් (පාලන) II
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

---